# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ 2171635
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1733/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 20/11/2024
පැය 1425

**මාධ්‍ය නිවේදනය**

## 01. මනුෂ්‍ය ඝාතනයක් - ඌරුබොක්ක පොලිස් වසම.

2024.11.19 වන දින රාත්‍රී කාලයේ ඌරුබොක්ක පොලිස් වසමේ පට්ටිගල ප්‍රදේශයේදී සිදු වූ මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් ඌරුබොක්ක පොලිස් ස්ථානය මඟින් විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 44 ක් වූ දල්ලන්ද වත්ත, පට්ටිගල, බෙරලපනාතර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි.**

මරණකරු නිවසට ජලය රැගෙන ඒම සඳහා නිවසින් බැහැර ගිය අවස්ථාවේ පුද්ගලයෙකු විසින් සිදු කල පහරදීමක් හේතුවෙන් තුවාල ලබා ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මිය ගොස් ඇත. පුද්ගලික ආරවුලක් මත මෙම ඝාතනය සිදු කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා ඌරුබොක්ක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. පස්වේල්ලකට යට වී ළමයෙකු මිය යාම - තෙල්දෙණිය පොලිස් ස්ථානය.

2024.11.20 වන දින අළුයම් කාලයේ තෙල්දෙණිය පොලිස් වසමේ ගල්ලැහැවත්ත ප්‍රදේශයේදී නිවසක් පිටුපස තිබූ වේල්ලක් එම නිවස මතට කඩා වැටීම හේතුවෙන් කාන්තාවක් හා පිරිමි ළමුන් දෙදෙනෙකු නිවසේ හා පස් වේල්ලේ සුන්බුන් වලට යටවී තුවාල ලබා මැදමහනුවර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් ළමයෙකු මිය ගොස් ඇත.

**මිය ගිය ළමයා වයස අවුරුදු 16 ක් වන ගල්ලැහැවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තුවාල ලැබූ වයස අවුරුදු 14 ක් වූ මියගිය ළමයාගේ සහෝදරයා හා වයස අවුරුදු 61 ක් වූ මිත්තණිය මැදමහනුවර රෝහලේ ප්‍රතිකාර ලබයි. තෙල්දෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දඹගල්ල පොලිස් ස්ථානය.**

2024.11.19 වන දින උදෑසන කාලයේ දඹගල්ල පොලිස් වසමේ අරළුවින්න ප්‍රදේශයේදී දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 47 ක් වන පඟුර, අරළුවින්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දඹගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.**

2024.11.20 වන දින අළුයම් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ අළුත්වැව ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 23 ක් වන වීරපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**